19 ඒකකය - පරිමාව

- පැත්තක දිග 1 cm වන ඝනකයක පරිමාව $1\ cm^3$ ලෙස හඳුන්වයි.
- පැත්තක දිග 1 m වන ඝනකයක පරිමාව $1\ m^3$ ලෙස හඳුන්වයි.



පරිමාව $= 1\ cm^3$



පරිමාව $= 1\ m^3$

- 

දිග පැත්තට ඇති කැට ගණන $= 7$
පළල පැත්තට ඇති කැට ගණන $= 3$
උස පැත්තට ඇති කැට ගණන $= 2$
ඝනකාභයේ පරිමාව $= 7 \times 3 \times 2$
$= 42\ cm^3$

ඒ අනුව, ඝනකාභයක පරිමාව =දිග × පළල × උස මගින් සෙවිය හැක.

ඝනකයක දිග, පළල හා උස සමාන බැවින්, ඝනකයක පරිමාව $=$ (පැත්තක දිග)^3 වේ.

- පහත දැක්වෙන ඝනකාභයේ පරිමාව සොයමු.



ඝනකාභයේ පරිමාව $= 8 \times 5 \times 3$
$= 120\ cm^3$

- පහත දැක්වෙන ඝනකයේ පරිමාව සොයමු.



ඝනකයේ පරිමාව $= 7 \times 7 \times 7$
$= 343\ cm^3$

- ඔබේ ගණිතය පෙළ පොතෙහි 19.1, 19.2,19.3, 19.4 ලෙස ඇති අභ්‍යාස සම්පූර්ණ කරන්න.